# 多言語情報コーナー　　（令和４年５月号）

## 1. බදු ගෙවීමේ පත්‍රිකාව පිළිබඳව

මැයි මාසයේදී, ඔබ ඔබේ දේපල සඳහා බදු ගෙවීමට සිදු වනු ඇත.
ඔබට මෝටර් රථයක් තිබේ නම්, මෝටර් රථ බද්ද සහ සැහැල්ලු වාහන බද්ද සඳහා බදු පත්‍රිකාවක් ලැබෙනු ඇත. ඔබට ලියුම් කවරය ලැබුණු විට, කරුණාකර එහි ඇති ලේඛන වහාම පරීක්ෂා කරන්න.

මෝටර් රථ බද්ද යනු සෑම වසරකම අප්‍රේල් 1 වැනි දිනට මෝටර් රථය හිමි පුද්ගලයා විසින් ගෙවිය යුතු බද්දකි. මෙය තොචිගි ප්‍රාන්තයට ගෙවිය යුතු බද්දකි.
සැහැල්ලු වාහන බද්ද සහ මොපෙඩ් හෝ සැහැල්ලු වාහනයක් හිමි පුද්ගලයකු විසින් ගෙවිය යුතු බද්දකි. තොචිගි නගරයට ගෙවිය යුතු බදු මෙයයි.
බදු ගෙවීමේ අවසාන දිනය මැයි 31 වේ. ලියුම් කවරයේ ඇති බදු දැන්වීම රැගෙන නියමිත දින තුළ ගෙවිය යුතු අතර එය කොන්බිනි වෙළඳසැල් , බැංකු, තැපැල් කාර්යාල යනාදිය මගින් ගෙවිය හැක.

එසේම, ජනවාරි 1 වනදා වන විට, තොචිගි නගරයේ ඉඩම් හෝ නිවාස ඇති අයට දේපල බද්ද සහ නගර සැලසුම් බද්ද සඳහා බදු ගෙවීමේ දැන්වීමක් ලැබෙනු ඇත.
දේපල බද්ද යනු ඔබ සතු ඉඩම හෝ නිවස මත අය කරන බද්දකි. නගර සැලසුම් බද්ද යනු නගර සැලසුම් කිරීම සහ ඉඩම් නැවත සකස් කිරීම සඳහා භාවිතා කරන බද්දකි. තොචිගි නගරයට ගෙවිය යුතු බදු මේවාය.

නියමිත දිනට බදු ගෙවන්න.

## 2. තොචිගි ප්‍රාන්ත පාපැදි ආඥාපනත පිහිටුවීම ගැන.

පාපැදි පාවිච්චි කරන පිරිස ගොඩක් සිටින අතර , තොචිගි ප්‍රාන්තයේ පාපැදි අනතුරු වැඩිවී තිබෙන අතර එමනිසා, තොචිගි ප්‍රාන්තය විසින් පාපැදි ආරක්ෂිතව භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම සහ අනතුරුවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සඳහා "තොචිගි ප්‍රාන්ත පාපැදි ආඥාපනත" පනවා ඇත. මෙම ආඥාපනත තොචිගි ප්‍රාන්තයේ පාපැදි භාවිතා කරන සියලුම පුද්ගලයින්ට අදාළ වේ.

2022 ජූලි 1 වැනිදා සිට පාපැදි රක්ෂණයක් ලබා ගැනීම අනිවාර්ය වේ. පාපැදි ආශ්‍රිත අනතුරු සඳහා විශාල වන්දි ප්‍රමාණයක් තීරණය කරන අවස්ථා රටපුරා ඇති බැවින්, පාපැදි වගකීම් රක්ෂණයක් ලබා ගැනීම අනිවාර්ය වී ඇත. සාමාන්‍යයෙන්, රක්ෂණය නගරයේ පාපැදි වෙළඳසැලකින් මිලදී ගත හැකිය. පාපැදි පරීක්ෂා කර සර්විස් කිරීමෙන් පසු බයිසිකල් වෙළඳසැල පාපැදිය සඳහා TS ලකුණ තබන බැවින් TS ලකුණ පාපැදියේ තිබීම ඔබට රක්ෂණයක් ඇති බවට ලකුණකි.

රක්ෂණය වසරක් සඳහා වලංගු වේ. රක්ෂණ වාරිකය වන්දි මුදල අනුව වෙනස් වේ, නමුත් TS ලකුණ නිල් සහ රතු වන අතර එය රතු නම්, ඔබට යෙන් 2,000 කට පමණ සම්බන්ධ විය හැකිය.
උපරිම වන්දි මුදල යෙන් මිලියන 100 කි.

එසේම අප්‍රේල් 01 වැනිදා සිට හිස්වැසුම් පැළඳීම සහ පාපැදිය පරීක්ෂා කර නඩත්තු කිරීම අනිවාර්ය වේ. පාපැදි අනතුරු වලින් මිය යන පුද්ගලයන්ගෙන් 60% ක් පමණ හිස තුවාල වී ඇත. ළමයින් පමණක් නොව සෑම වයස් කාණ්ඩයකම පුද්ගලයින් හැකිතාක් හිස්වැසුම් පැළඳිය යුතුය. හිස්වැසුම් පාපැදි වෙළඳසැල්, නිවාස වැඩිදියුණු කිරීමේ වෙළඳසැල්, ක්‍රීඩා භාණ්ඩ වෙළඳසැල් සහ විශාල සුපිරි වෙළඳසැල් වලින් මිලදී ගත හැකිය.

මීට අමතරව, එනම් ජංගම දුරකථනය භාවිතා කරමින් පාපැදි පැදීම, තවත් කෙනෙකු නංවාගෙන යාම හෝ කුඩයක් ඉහලාගෙන පාපැදි පැදීම යනාදිය නතර කලයුතු වේ.

## 3. නව කොරෝනා වෛරසය ආසාදනය පිළිබඳව

මාර්තු මාසයේ සිට සාමාන්‍යයෙන් අඩුවෙමින් තිබූ නව කොරෝනා වෛරසය සමඟ නව ආසාදන සංඛ්‍යාව මෑතකදී ජපානය පුරා වැඩිවන ප්‍රවණතාවක් වෙත හැරී ඇත.
මැයි මාසයේ තිබෙන දීර්ග නිවාඩු කාලය  තුල ජන සංක්‍රමණය වැඩිවීම හේතුවෙන් අලුතින් ආසාදිතයන් සංඛ්‍යාව ඉහළ යනු ඇතැයි විස්වාස කෙරේ .

ඉදිරියේදී තවමත් තුන්වන එන්නත ලබා නොගත් පුද්ගලයින්ට නිසි පරිදි එන්නත ලබා ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තොචිගි නගරය තුල , අපි පළමු සහ දෙවන එන්නත් කිරීමෙන් මාස 6 ක් ගත වූ පුද්ගලයින්ට තුන්වන එන්නත් පත්‍රිකාව ඔබ වෙත ඒවා ඇත. ඔබට එන්නත් පත්‍රිකාව ලැබී ඇත්නම් සහ එන්නත ලබා ගැනීමට කැමති නම්, කරුණාකර ඔබගේ ප්‍රදේශයේ ඇති වෛද්‍ය මධ්‍යස්ථානයකට හෝ නගරයේ ඇති ප්‍රධාන එන්නත්කරණ මධ්‍යස්ථානය වෙත අයදුම් කරන්න.

ඔබ වෙනත් ප්‍රදේශයකින් නිකුත් කරන ලද එන්නත් ප්‍රවේශ පත්‍රයක් සමගින් දෙවන එන්නතක් ලබාගෙන තිබේ නම්, හෝ ඔබ විදේශයකදී එන්නත් කර තොචිගි නගරය වෙත පැමිණ ඇත්නම්, තුන්වන එන්නත් ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීමට නැවත අයදුම් කිරීමට අවශ්‍ය වේ. ඔබට ඔබේ එන්නත් කිරීමේ අයදුම් පත්‍රය නැති වුවහොත්, ඔබට එය නැවත ලබා ගත හැකිය.

එන්නත් කිරීම සම්බන්ධයෙන් වෙන් කිරීම් සහ විමසීම් සඳහා, කරුණාකර තොචිගි නව කොරෝනා වෛරස ආසාදන  එන්නත් කිරීමේ ඇමතුම් මධ්‍යස්ථානය 0282-21-2418 අමතන්න.